**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අවසාන විභාගය - ජූලි 2014

## (58) බදුකරණය

(Taxation)

---

**ප්‍රශ්න අංක 01** - ලකුණු 35

**1.1. පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

වගකීම සීමිත පෞද්ගලික සමාගමක ආදායම් බදු ගණනය කිරීම

**1.2. කාර්ය සාධනය - සංක්ෂිප්තව**

මෙම ප්‍රශ්නය ලකුණු 35 කින් යුතුවේ. ලබාගත් සාමාන්‍ය ලකුණු 18ත් 20ත් අතර විය.සෑම සිසුවෙක්ම පාහේ මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි.

**1.3. අසතුටුදායක පිළිතුරු සඳහා හේතු**

- සෑම සිසුවෙක්ම පාහේ පරිපාලිත සමාගමට ගෙවූ පොලිය සම්බන්ධව වූ ගැලපීම කර නොතිබුණි.
- ඉවත් කිරීමේ ලාභය ගණනය කිරීම සඳහා ඉතා දුර්වල පිළිතුරු සපයා තිබුණි.
- කළමනාකරණ ගාස්තු ගැලපීම ද නිවැරදිව සිදුකර නොතිබුණි.
- සමහර සිසුන් බොල් ණය අයකර ගැනීම සඳහා දැරූ නීති වියදම් ඉඩනොදෙන අයිතමයක් ලෙස සලකා තිබුණි.
- සමහර සිසුන් සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා වූ පුවත්පත් දැන්වීම ඉඩදී නොතිබුණි.
- පසුගිය වසරේ ලියාහරින ලද සේවක ණය අයකර ගැනීම් සම්බන්ධ ගැලපීම ද නිවැරදිව බදු ගණනයට ගෙන නොතිබුණි.
- ක්ෂය දීමනා සඳහා වැරදි අනුපාත භාවිතා කර තිබුණි. ප්‍රශ්නයට අනුව, සමහර වත්කම් සඳහා සම්පූර්ණයෙන් ක්ෂය දීමනා ලබා ගෙන ඇතත්, සමහර සිසුන් එම වත්කම් සඳහා ද ක්ෂය දීමනා ගණනය කර තිබුණි.
- වැරදි බදු අනුපාත භාවිතා කොට තිබුණි.

**1.4. වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ**

සිසුන් මෙවැනි ආකාරයේ ප්‍රශ්නවලට විශේෂයෙන් පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය. එසේම, ඉඩ දෙන සහ ඉඩ නොදෙන වියදම් සඳහා හේතු පැහැදිලිව දැක්විය යුතුය.

## ප්‍රශ්න අංක 02 - ලකුණු 30

**2.1. පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

පුද්ගලයකුගේ ආදායම් බදු බැදියාව ගණනය කිරීම

**2.2. කාර්ය සාධනය - සංක්ෂිප්තව**

බොහෝ අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නයට ලකුණු 30 ක් හිමිවේ. සාමාන්‍ය ලකුණු 18ත් 20ත් අතර විය.

**2.3. අසතුටුදායක පිළිතුරු සඳහා හේතු**

- සමාගම සපයන ලද නවාතැන් පහසුකම හා ගුවන් ටිකට්පත් නිවැරදිව බදු ගණනයට ගෙන නොතිබුණි.
- සමාගම සපයන ලද කුලී රහිත නිවස සහ ගෘහ භාණ්ඩ ප්‍රතිලාභය බදු ගණනයට ගෙන නොතිබුණි.
- රු. 100,000 /- ක අතිරේක නිදහස් කිරීම සැලකිල්ලට ගෙන නොමැත.
- ගස් විකිණීම (ප්‍රාග්ධන ලාභ) බදු ගණනයට ගෙන තිබුණි.
- ස්ථාවර තැන්පතු පොලී - ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා නිදහස් කිරීම ද බදු ගණනයට ගෙන තිබුණි.
- ඒකක භාරවලින් ලැබුනු ලාභාංශ බදු නිදහස් ආදායමක් වුව ද එය ආදායම් ප්‍රභවයක් ලෙස සලකා තිබුණි.
- ණයපත් පොලිය අඩු කිරීමක් ලෙස බදු ගණනයට ගෙන තිබුණි.
- සමහර සිසුන් ආපසු ගෙවූ නිවාස ණය ප්‍රාග්ධන කොටස අඩු කිරීමක් ලෙස ගෙන අඩු කොට තිබුණි.

**2. 4. වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ**

පුද්ගලයකුගේ ආදායම් බදු බැදියාව ගණනය කිරීමේදී අඩු කළ යුත්තේ කුමක්ද? අඩු නොකළ යුත්තේ කුමක්ද? යන්න පිළිබඳ ව මනා දැනුමක් සිසුන් විසින් ලබාගත යුතු වේ. වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය.

ආදායම් බදු නීතියට වූ නව වෙනස්වීම් පිළිබඳ ව කියවීමෙන් හා පුහුණු වීම මගින්, සිය දැනුම යාවත්කාලීන කරගැනීම අවශ්‍ය වේ.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 16

**3.1. පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

මෙම ප්‍රශ්නයෙන් පහත දෑ පරීක්ෂා කොට ඇත.

(A) (a) බෙදා හැරිය හැකි ලාභය

(b) අඩුවෙන් බෙදාහරින ලද ලාභ මත බද්දෙන් වැළකීම සඳහා බෙදා හැරිය යුතු අවම ලාභාංශය

(c) අඩුවෙන් බෙදාහරින ලද ලාභ මත බදු වගකීම (Deemed dividend tax liability.)

(B) එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීම සඳහා පිරිවැටුමේ සීමාව

### 3.2. කාර්ය සාධනය - සංක්ෂිප්තව

- (A) කොටස සඳහා සපයා තිබූ පිළිතුරු ඉතා දුර්වලය. 5% ත් 10%ත් අතර අපේක්ෂකයන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුරු සැපයීමට සමත්ව තිබුණි. මෙම කොටසට ලබාගත් සාමාන්‍ය ලකුණු 02 ත් 04 ත් අතර විය.
- 60% ක පමණ අපේක්ෂකයන් ප්‍රමාණයක් (B) කොටසට නිවැරදි පිළිතුර සැපයීමට සමත්ව තිබුණි.

### 3.3. අසතුටුදායක පිළිතුරු සඳහා හේතු

- බෙදා හැරිය හැකි ලාභය සහ අඩුවෙන් බෙදාහරින ලද ලාභ මත බදු වගකීම ගණනය කරන ආකාරය සිසුන් විසින් නිවැරදිව අවබෝධ කර ගෙන නොමැත. තව ද ඉහත දෑ ගණනය කිරීමට නිවැරදි පියවරයන් අනුගමනය කර නැත.
- සමහර සිසුන් අඩුවෙන් බෙදාහරින ලද ලාභ මත බදු වගකීම ගණනය කිරීමට සමාගම් බදු අනුපාත භාවිතා කර තිබුණි.
- බෙදා හැරිය හැකි ලාභය ගණනය කිරීමේ දී සමහර සිසුන් නිවැරදි ක්ෂය කොටස (ගිණුම්කරණ ක්ෂය) යෙදීමට අපොහොසත්ව තිබුණි.

### 3.4. වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ

සිසුන් විසින් විවිධ තොරතුරු සහිත ව මේ ආකාරයේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය. බෙදා හැරිය හැකි ලාභය සහ අඩුවෙන් බෙදාහරින ලද ලාභ මත බදු වගකීම ගණනය කිරීමේ නිවැරදි ක්‍රමය අවබෝධ කර ගැනීමට ඔවුන්ට හැකි වන්නේ එසේ කළහොත් පමණි.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 11

### 4.1. පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?

(A) (a) 2013 /14 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට නියමිත දිනයන්

(b) සමාගමට ස්ව තක්සේරු ක්‍රමය යටතේ දඩ මුදල් ගෙවීමෙන් වැළකී සිටිය හැකි ආකාරය

(B) ආදායම් වාර්තාව නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමේ වාසි

### 4.2. කාර්ය සාධනය - සංක්ෂිප්තව

(A) (a) 40% ත් 50%ත් අතර සිසුන් ප්‍රමාණයක් ආදායම් බදු ගෙවීමට නියමිත දිනයන් සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට සමත්ව තිබුණි. නමුත් ඔවුන් බොහෝ දෙනෙක් කාර්තුමය ගෙවීම් පෙර වසරේ ගෙවිය යුතු බද්දෙන් 1/4 ක් මත පදනම් වන බව සඳහන් කිරීමට අපොහොසත්ව තිබුණි. මෙම ප්‍රශ්නයට ලබාගත් සාමාන්‍ය ලකුණු 06 න් 03 ත් 04 ත් අතර විය.

(b) මෙම කොටස ඉතා පහසු වුවද බොහෝ අපේක්ෂකයන් නිවැරදි පිළිතුර සැපයීමට අසමත්ව තිබුණි.

(c) 30% ක පමණ සිසුන් ප්‍රමාණයක් මෙම කොටසට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**4.3. අසතුටුදායක පිළිතුරු සඳහා හේතු**

(A) (a) සමහර සිසුන් ආදායම් බදු ගෙවීම සඳහා වැරදි දින සඳහන් කර තිබුණි.

(b) බොහෝ සිසුන් ප්‍රශ්නයේ මෙම කොටස නියමාකාරයෙන් අවබෝධ කර ගෙන නොමැත.

(B) සමහර සිසුන්

- බදු අධිකාරින් මෙම සමාගම හොඳ බදු ගෙවන සමාගමක් ලෙස සලකනු ඇත.
- මෙම සමාගම අවංක සමාගමක් ලෙස සලකනු ඇත.

වැනි පිළිතුරු සපයා තිබුණි.

**4.4. වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ**

සිසුන් මේ ආකාරයේ ප්‍රායෝගික ප්‍රශ්නවලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය. ඔවුන් සටහන් හොඳින් කියවිය යුතු අතර ප්‍රායෝගිකව සිදු වන ආකාරය සොයා බැලිය යුතුය.

## ප්‍රශ්න අංක 05 - ලකුණු 08

**5.1. පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

(A) (a) යම් පුද්ගලයකු දරුවකු ලෙස සැලකීමට සපුරාලිය යුතු කොන්දේසි

(b) දරුවාගේ ආදායම එකතු කළ යුත්තේ කාටද

(B) ජාතිය ගොඩ නැගීමේ බද්ද ගණනය කිරීම

**5.2. කාර්ය සාධනය - සංක්ෂිප්තව**

(A) (a) බොහෝ අපේක්ෂකයන් ප්‍රශ්නයේ මෙම කොටසට පිළිතුරු සැපයීමට සමත්ව තිබුණි. දරුවා යන සංකල්පය පිළිබඳව හොඳ දැනුමක් ඔවුන්ට තිබේ. බොහෝ සිසුන් ලකුණු 03 න් 02 ක් ලබා ගැනීමට සමත්ව තිබුණි.

(b) බොහෝ සිසුන් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. බහුතරයක් ආදායම දරුවා රැක බලා ගන්නා පුද්ගලයාට එකතු කළ යුතුය වැනි පිළිතුරු සපයා තිබුණි.

(c) බහුතරයක් අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සැපයීමට සමත්ව තිබුණි.

**5.3. අසතුටුදායක පිළිතුරු සඳහා හේතු**

(A) (a) සමහර සිසුන් දරුවාගේ ආදායම පියාගේ ආදායමට එකතු කළ යුතුය යනුවෙන් පිළිතුරු සපයා තිබුණි.

**5.4. වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ**

සිසුන් ප්‍රශ්නය හොඳින් කියවිය යුතු අතර නිවැරදි කරුණට අදාළව පිළිතුරු සැපයිය යුතුය. තව ද ජාතිය ගොඩ නැගීමේ බද්ද ගණනය කිරීමේදී කෙටි ක්‍රම භාවිතා නොකොට නිවැරදි සූත්‍රය භාවිතා කළ යුතුය.

\- - - -

## පොදු අදහස්

(1) සිසුන් බදු නීතියට වන සංශෝධන දැන සිටිය යුතුය.

(2) බදු පරිපාලනය සඳහා වන ප්‍රතිපාදන හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.

(3) බදු පරිපාලන ප්‍රතිපාදන අදාළ කිරීම පිළිබඳව හොඳින් හැදෑරිය යුතුය.

(4) සාමාන්‍යයෙන් විෂය නිර්දේශයට අයත් යම් කොටසක් විශේෂයෙන් බදු පරිපාලනය යටතේ ආවරණය කරමින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් පෙළඹී සිටී. එනම්, ඔවුන් දන්නා දේ ලිවීම මිස අසා ඇති ප්‍රශ්නයට අදාළ පිළිතුර සැපයීම නොවේ. බදු ප්‍රශ්න නිශ්චිත වන අතර ඒවාට නිශ්චිත පිළිතුරු අවශ්‍ය වේ. දීර්ඝ පිළිතුරු ලියා පිටු පිරවීමෙන් ලකුණු නොලැබෙන බව අපේක්ෂකයන් සිහි තබා ගත යුතුය.

(5) බොහෝ සමාගම් සඳහා අඩුවෙන් බෙදාහරින ලද ලාභ මත බද්ද අදාළ වේ. එම නිසා සිසුන් ඒ පිළිබඳව දැනුවත් ව සිටිය යුතුය.

- * * * -